| 11 ශ්‍රේණිය | **භයවන ඒකකය**<br>**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය**<br>**Information & Communication Technology** | I කොටස |
|---|---|---|

1. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් 2015 දී කරන ලද සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවෙහි පරිගණක සාක්ෂරතාව 26.8% කි. අංකිත බෙදුම (Digital divide) මෙම අඩු සාක්ෂරතාවයට එක් හේතුවක් ලෙස ලෙස සලකනු ලැබේ. පහත දැක්වෙන යෝජනා සලකන්න. (2016)

A - අඩු ආදායම්ලාභී නිවැසියන්ට පරිගණක මිලදී ගැනීම සඳහා අඩු පොළියට ණය පහසුකම් සැලසීම.
B - පරිගණක සහ අන්තර්ජාල පහසුකම් ප්‍රමාණවත් නොවන ග්‍රාමීය ප්‍රදේශවලට එම පහසුකම් ලබා දීම.
C – 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව සමතුන්ට ශිෂ්‍යත්ව වැඩි සංඛ්‍යාවක් ලබා දීම.
අංකිත බෙදුම අඩු කිරීමට දායක වන යෝජනාව/ යෝජනා වනුයේ,

1) A පමණි
2) B පමණි
3) A හා B පමණි
4) B හා C පමණි

2. පහත දැක්වෙන වගන්ති සලකන්න. (2016)

A - භාවිත කළ නොහැකි ජංගම දුරකථන, CRT මොනිටර් වැනි ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය, ඉවතලන ආහාර වැනි ගෘහස්ථ කසල සමග බැහැර කිරීම සුදුසු ය.
B - මේස පරිගණකයක (Desktop computer) තිබෙන තනි පරිශීලක බලපත්‍රය සහිත මෘදුකාංගයක් විවිධ පරිශීලකයන් විසින් භාවිත කිරීම නීති විරෝධී නොවේ.
C - පරිගණක ජාලයක් සඳහා ගිනි පවුරක් ස්ථාපනය කර ඇති විට පරිශීලකයින් තමන්ගේ රහස්‍ය තොරතුරු අඩංගු ගොනු මුරපද මගින් ආරක්ෂා කර ගැනීම අවශ්‍ය නොවේ.
ඉහත කුමන වගන්තිය/ වගන්ති සත්‍ය වේ ද? (2016)

1) A පමණි
2) B පමණි
3) A හා B පමණි
4) B හා C පමණි

3. පහත සඳහන් වගන්ති සලකන්න. (2017)

A - සොරකම් කරන ලද වෙනත් අයකුගේ පරිශීලක නාමය (user ID) සහ මුරපදයක් (password) භාවිත කර පරිගණකයකට ප්‍රවේශ වීම
B - බලපත්‍ර සඳහා මුදල් ගෙවීමක් නොකර නිදහස් හා විවෘත මූල මෘදුකාංග (free and open source software) බාගැනීම (downloading) හා ස්ථාපනය (installing) කිරීම
C -මාර්ගගත (online) සාප්පුවක කළමණාකරු විසින් පාරිභෝගිකයන්ගේ කැමැත්ත නොමැතිව ඔවුනගේ විද්‍යුත් තැපැල් ලිපින ලැයිස්තුවක් අලෙවිකරණ සමාගමකට විකිණීම

ඉහත සඳහන් කවර නිදසුන් මගින් සදාචාර විරෝධී (ethical issue) ක්‍රියාකාරකම් සිදු වේ ද?

1) A සහ B මගින් පමණි
2) B සහ C මගින් පමණි
3) A සහ C මගින් පමණි
4) A, B හා C සියල්ල ම මගිනි

4. පහත වගන්ති සලකා බලන්න. (2017)

A - නිර්බාධක ජව සැපයුම (UPS)
B - මෘදුකාංග ගිනිපවුර (Software Firewall)
C - පරිගණකයකට ප්‍රවේශ වීම (Login) සඳහා පරිශීලක නාම (Username) හා මුරපද (Password) භාවිතය
ඉහත සඳහන් කවරක් තාර්කික ආරක්ෂාව සඳහා නිදසුන් වේ ද?

1) A හා B පමණි
2) A හා C පමණි
3) B හා C පමණි
4) A, B හා C සියල්ලම

5. පහත සඳහන් කවරක් අන්තර්ජාල භාවිතයේ නිරුපද්‍රිත භාවිත සඳහා උදාහරණ වන්නේ ද? (2017)

A - දුරකථන අංකය හා ලිපිනය වැනි පෞද්ගලික තොරතුරු සමාජ ජාලවලදී සඟවා තැබීම.
B - නොදන්නා පුද්ගලයින්ගෙන් ලැබෙන විද්‍යුත් තැපැල් ලිපිවල ඇති සන්ධාන (Link) මත ක්ලික් කිරීම.
C - සමාජ ජාලවලදී නාඳුනන අය සමග සන්නිවේදනය කිරීම.

1) A පමණි
2) B පමණි
3) C පමණි
4) A හා C පමණි

ICT Tutorials HUB

6. පහත සඳහන් වගන්ති සලකන්න. (2017)

A – e අපද්‍රව්‍ය (Electronic waste) අපරීක්ෂාකාරී අයුරින් පරිසරයට බැහැර කිරීම.
B - භාවිතයට ගත නොහැකි සංයුක්ත ප්‍රදීප්ත පහන් (CFL) සහ අනෙකුත් ඉලෙක්ට්‍රොනික උපකරණ (Devices) ප්‍රතිචක්‍රීය මධ්‍යස්ථාන වෙත බාර දීම.
C - භාවිත කළ හැකි මට්ටමේ පවතින ඉලෙක්ට්‍රොනික උපකරණ ඉවත නොදමා වෙනත් අයට විකිණීම හෝ පරිත්‍යාග කිරීම.


ඉහත සඳහන් දෑ අතුරෙන් ආරක්ෂිත e-අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නිදසුන් වන්නේ,

1) A හා B පමණි
2) A හා C පමණි
3) B හා C පමණි
4) A, B හා C සියල්ලම

7. පරිගණකයේ දෘඪ තැටි අකර්මන්‍යවීම්වලින් දත්ත හා තොරතුරු ආරක්ෂා කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි හොඳ පුරුද්දක් වන්නේ පහත සඳහන් කවරක් ද? (2019)

1) ගිනිපවුරක් (Firewall) ස්ථාපනය කිරීම.
2) ප්‍රතිවෛරස් මෘදුකාංගයක් ස්ථාපනය කිරීම.
3) කාලීනව උපස්ථ (Backups) ලබාගැනීම.
4) ප්‍රබල මුරපදයක් භාවිත කිරීම.

8. පහත දක්වා ඇති ඉරියව් අතුරෙන් පරිගණක භාවිතාවේ දී නිවැරදි වන්නේ කවරක් ද? (2019)




9. පහත සඳහන් කවර වගන්ති සත්‍ය ද? (2020)

A - අංකිත බෙදුම (Digital divide) මගින් දෘඪාංග, ප්‍රතිසම (Analog) සහ අංකිත (Digital) ලෙස ප්‍රභේද දෙකකට වෙන් කරනු ලබයි.
B - පරිගණක ක්‍රමලේඛ නීතිවිරෝධි ලෙස පිටපත් කිරීම මෘදුකාංග චෞරත්වය (Piracy) වේ.
C - අංකිත සාක්ෂරතාවය (Digital literacy) මගින් අංකිත බෙදුම අඩු කළ හැක.

1) A හා B පමණි
2) A හා C පමණි
3) B හා C පමණි
4) A, B හා C සියල්ලම

10. අනිෂ්ඨ මෘදුකාංග (Malicious software) සම්බන්ධයෙන් පහත සඳහන් කුමන වගන්ති(යක්) නිවැරදි වන්නේ ද? (2020)

A - ට්‍රෝජන් අශ්වයා (Trojan horse) යනු ඔත්තු බැලීමේ මෘදුකාංග (Spyware) ආකාරයක් වේ.
B - පරිගණක වර්ම්ස්වලට ස්වයංව පැතිරීම සිදු කළ හැකි ය.
C - තතුබෑම (Phishing) යනු පරිගණක තිරය මත අනවශ්‍ය පණිවුඩ ප්‍රදර්ශනය කරනු ලබන ශිල්පීය ක්‍රමයකි.

1) A පමණි
2) B පමණි
3) A හා B පමණි
4) B හා C පමණි

11. …………………. පරිගණකයක ඇති අනෙකුත් විධානීය ගොනුවලට (executable files) තම පිටපත් ඇතුළත් කරමින් පැතිරෙයි. (2021)

1) පරිගණක වර්ම් (computer worm)
2) කොල්ලකරු (hijacker)
3) ඔත්තු බැලීමේ මෘදුකාංග (spyware)
4) ට්‍රෝජන් අශ්වයා (Trojan horse)

12. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය නිසා පහත සඳහන් කවරක් ඉස්මතු විය හැකි වන්නේ ද? (2021)

A - විද්‍යුත් අපද්‍රව්‍ය ගැටලු
B - ආරක්ෂණ තර්ජන
C - සෞඛ්‍යමය උපද්‍රව

1) A සහ B පමණි
2) A සහ C පමණි
3) B සහ C පමණි
4) A, B සහ C සියල්ලම

ICT Tutorials NJB